# රීති හා රෙගුලාසි

## 22 වැනි වරට පවත්වන

# ජනමාධ්‍ය විශිෂ්ටතා සම්මාන උළෙල

## 2020



ශ්‍රී ලංකා කර්තෘ සංසදය වසර 1990 සිට ජනමාධ්‍ය විශිෂ්ටතා සම්මාන උළෙල වර්ෂයක් පාසා පවත්වයි. පුවත්පත් කලාවේ වෘත්තීය විශිෂ්ටතා ප්‍රවර්ධනය කිරීමේ පොදු පරමාර්ථයෙන් ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය වසර 2003 සිට එම කාර්යය හා අත්වැල් බැදගෙන සිටී. පුවත්පත් ආයතනය පිහිටවුයේ වසර 2003 දීය. ඒ ඒ වසරවලදී වෘත්තීය විශිෂ්ටතා දක්වන ජනමාධ්‍යවේදීන්ට ඒ අයුරින් සම්මාන පිරිනැමේ.

## ජනමාධ්‍ය විශිෂ්ටතා යනු කවරේද ?

මෙය වෘත්තීය සම්මානයන් විසින් හොඳ පුවත්පත් කලාව හඳුනාගැනීම හා එය උත්සවාකාරයෙන් සැමරීමත් සඳහා වන විශිෂ්ටතම වාර්ෂික පුවත්පත් කලාවේදී සම්මාන ප්‍රදානෝත්සවයයි. එමෙන්ම මෙය පුවත්පත් කලාව වෙනුවෙන් දැක්වෙන ධෛර්යය කැපවීම හා විශිෂ්ටත්වය ඇගයීමත් ඒ වෙනුවෙන් ප්‍රතිලාභ ප්‍රදානයත් වෘත්තීය වෙනුවෙන් පිරිනැමුණු යාවජීව දායකත්වයට හා සේවයට ගෞරව දැක්වීමක් පිළිබඳ කාර්යයකි.

## ඉල්ලුම් කළ හැක්කේ කාටද?

පුවත්පත් කලාවේදී විශිෂ්ටතා සම්මාන වැඩ පිළිවෙළේ අරමුණ අනුව ශ්‍රී ලංකාවෙහි පළ කෙරෙන පුවත්පත්හි පළ කරනු පිණිස ලිපි හා ප්‍රවෘත්ති වාර්තා ලියන ඕනෑම ශ්‍රී ලාංකික පුවත්පත් කලාවේදියකුට මේ සඳහා අයැදුම්පත් ඉදිරිපත් කළ හැක්කේය. ඔහු හෝ ඇය පුවත්පත් කලාවෙහි පූර්ණ කාලීනව නියුක්තව සිටින්නකු හෝ සිටින්නියක හෝ පුවත්පත්හි පළ වීම සඳහා ලිපි හා ප්‍රවෘත්ති වාර්තා ලියූ තැනැත්තකු තැනැත්තියක හෝ විය යුතු අතර නියමිත කාලය තුළ ඔහුගේ හෝ ඇගේ ලිපි/ප්‍රවෘත්ති වාර්තා අවම වශයෙන් 10ක් වත් පළ වී තිබිය යුතුයි.

පුවත්පත් කලාව පිළිබඳ ශිෂ්‍යයකු හෝ ආධුනියකු වශයෙන් කෙනකු විසින් පළ කරන ලද ලිපි/ප්‍රවෘත්ති වාර්තා ද සලකා බලනු ලැබේ.

## පුවත්පතක් යනු කුමක්ද?

පුවත්පත් කලාවේදී විශිෂ්ටතා සම්මාන වැඩ පිළිවෙළේ අරමුණ අනුව ශ්‍රී ලංකාවෙහි පළ කෙරෙන පුවත්පත්හි පළ කරනු පිණිස ලිපි හා ප්‍රවෘත්ති වාර්තා ලියන ඕනෑම ශ්‍රී ලාංකික පුවත්පත් කලාවේදියකුට මේ සඳහා අයැදුම්පත් ඉදිරිපත් කළ හැක්කේයි ඔහු හෝ ඇයට පුවත්පත් කලාවෙහි පූර්ණ කාලීනව නියුක්තව සිටින්නකු හෝ සිටින්නියක හෝ පුවත්පත්හි පළ වීම සඳහා ලිපි හා ප්‍රවෘත්ති වාර්තා ලියූ තැනැත්තකු/තැනැත්තියක හෝ විය යුතු අතර නියමිත කාලය තුළ ඔහුගේ හෝ ඇගේ ලිපි/ප්‍රවෘත්ති වාර්තා අවම වශයෙන් 10ක් වත් පළ වී තිබිය යුතුය.

පුවත්පත් කලාව පිළිබඳ ශිෂ්‍යයකු හෝ ආධුනියකු වශයෙන් කෙනකු විසින් පළ කරන ලද ලිපි/ප්‍රවෘත්ති වාර්තා ද සලකා බලනු ලැබේ.

### ප්‍රකාශන කාලය

ලිපි/ප්‍රවෘත්ති වාර්තා 2020 ජනවාරි 01 වැනිදාත් 2020 දෙසැම්බර් 31 වැනිදාත් අතර කාලය තුළ පළ වී තිබිය යුතුය.

### අයඳුම් කරන්නේ කෙසේ ද ?

අයඳුම් පත්‍ර හා නාම යෝජනා මෙම ලිපිනයට එවිය යුතුය.

**කැඳවුම්කරු, පුවත්පත් කලාවේදී විශිෂ්ටතා සම්මාන ඒකාබද්ධ කමිටුව, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය බාරේ, 96, බර්නාඩ් සොයිසා මාවත, (කිරුළ පාර), කොළඹ 05**

### අයඳුම්පත් බාරගන්නා අවසාන දිනය

2021 ජූලි 15 දින ඉල්ලුම්පත් බාරගන්න අවසන් දිනයයි. සඳුදා සිට සිකුරාදා දක්-වා සතියේ වැඩ කරන දිනයන්හි පෙරවරු නවය (9) සිට පස්වරු පහ (5) දක්වා ඉල්ලුම්පත් බාර දිය හැකිය.

**ඉල්ලුම්පත් බාරගන්නා අවසන් දිනය දිගු නොකරන බව කරුණාවෙන් සලකන්න.**

# පොදු නීති රීති

• අයදුම්පත පමණක් පිටපත් තුනකින් එවිය යුත්තේය.
• අයදුම්කරුගේ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලිවිය යුත්තේය.
• ඡායා පිටපත් (ෆොටෝකොපි) ඉදිරිපත් කරන්නේ නම් සෑම ඡායා පිටපතකම කර්තෘගේ මුද්‍රව තිබිය යුත්තේය. මුල් ඡායා පිටපතෙහි සත්‍ය පිටපතක් බව හැම ඡායා පිටපතකම කර්තෘගේ මුද්‍රව කර්තෘගේ අත්සන තැබිය යුත්තේය.
• අයදුම්පත් පිළිවෙලට බැඳ තිබිය යුත්තේය. තනි තනි පිටු බාර නොගැනේ.
• ඉල්ලුම් කරන අංශය ක්ෂේත්‍රය පැහැදිලිවම සටහන් විය යුත්තේය. සුදුසු කොටුවෙහි හරියක් දමන්න.
• සම්මානය ඉල්ලුම් කරන අංශය වෙනුවෙන් ඉල්ලුම්පත සමග අවශ්‍ය වන විශේෂාංග ලිපි/ඡායාරූප/කාටූන් හා ප්‍රවෘත්ති වාර්තා අමුණා තිබිය යුත්තේය.
• ඇතැම් අංශ වෙනුවෙන් අවශ්‍යවන ප්‍රකාශ ඉල්ලුම්පත සමඟ ඇමිණිය යුත්තේය. එම ප්‍රකාශය වචන 250 කට නොවැඩි විය යුත්තේය.
• අවශ්‍ය කොන්දේසි සපුරා ඇති බවටත් සම්මානය ඉල්ලුම් කරන අංශයට සුදුසුකම් සපුරා ඇති බවටත් කර්තෘවරයා ඉල්ලුම්පතෙහි සිය අත්සන තැබිය යුත්තේය. (බී කොටස) පැමිණිලි නිරාකරණයේදී පුවත්පත් පැමිණිලි කොමිසමේ විධි විධාන හා නීති රීති ද ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ ආචාර ධර්ම සංග්‍රහය ද පිළිපදින බවටත් කර්තෘ වරයා සහතික කළ යුත්තේය (සී කොටස).
• ඉල්ලුම්කරු අරුඩ නාමයක් පාවිච්චි කරන්නේ නම් එම නම් දෙකම ඉල්ලුම් කරුගේ බවට කර්තෘ ලිපියක් මගින් සහතික කොට එය ඉල්ලුම්පත සමඟ එවිය යුත්තේය.
• විශේෂාංග / ලිපි/ ඡායාරූප/කාටූන්/ප්‍රවෘත්ති වාර්තා එකම අංශයක් (ක්ෂේත්‍රයක්) වෙනුවෙන් ඉදිරිපත් කළ යුත්තේය. එහෙත් එය වෙනත් අංශයක (ක්ෂේත්‍රය) සැලකිල්ල සඳහා යොමු කිරීමට විනිශ්චයකරුවනට හැකියාව ඇත්තේය.
• ඉල්ලුම්කරු පුවත්පත් කිහිපයක සේවය කරන්නේ නම් සම්මාන සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රය තමාගේ කර්තෘත්වය දරන පුවත්පතට සම්බන්ධ විය යුතු බවට කර්තෘවරයා සහතික විය යුත්තේය.
• විශේෂාංග ලිපි / ඡායාරූප /කාටූන්/ හා ප්‍රවෘත්ති වාර්තා පුවත්පතක පළ වීමෙන් පසු කිසියම් නිවැරදි කිරීමක්, පැහැදිලි කිරීමක් හෝ ඉල්ලා අස්කර ගැනීමක් වෙතොත් එය ද ඉල්ලුම්පත්‍රයේ කොටසක් සේ ඉදිරිපත් කළ යුත්තේය. එම විශේෂාංග ලිපිය ඡායාරූප/ කාටූන්/ ප්‍රවෘත්ති වාර්තා සම්බන්ධයෙන් කිසියම් ලිඛිත අභියෝගයක් වෙතොත් එහි පිටපත් ද ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුත්තේය. පුවත්පත් ආයතනයේ ප්‍රතිචාරයක් වෙතොත් එය ද අමුණා තිබිය යුත්තේය. එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් සම්මානය ප්‍රදානයෙන් පසුව හෝ ඉවත් කරගැනීමට සිදු විය හැක්කේය.
• අවශ්‍යතාවයක් මතු වුවහොත් ඉල්ලුම්කරුවන් සම්මුඛ සාකච්ඡාවකට කැඳවීමට විනිසුරුවන්ට හැකියාව ඇත්තේය.
• කිසියම් ආකාරයක උපකාර පැතීම්, බලපෑම් කිරීම්, කැමති කරවා ගැනීම් හෝ ඉල්ලුම්කරුවන් විසින් විනිසුරුවන්ට තර්ජන කිරීම් ඉල්ලුම්පත අවලංගු වීමට හේතු වන්නේය.
• විනිශ්චකරුවන්ගේ තීරණය අවසන් තීරණයයි. එම තීරණය නිශ්චිත හා ඒකාන්ත තීරණයකි. එම තීරණය කිසිඳු හේතුවක් නිසා අභියෝගයට ලක් කළ නොහැක්කේය.

## සම්මාන පිදෙන පුවත්පත් හා අන්තර්ජාල වෙබ් අඩවි අංශ සඳහා ඉල්ලුම් කළ හැකි නීතිරීති

### 1) මර්වින් ද සිල්වා වසරේ ජනමාධ්‍යවේදී සම්මානයඃ

එක් සම්මානයකි.
ඉල්ලුම්පත සමඟ අවම වශයෙන් ඉදිරිපත් කිරීම් (ප්‍රකාශන දහයක්) (10) යොමු කළ යුතුය. මෙම සම්මානය පිරිනැමෙනුයේ ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ ආරම්භක සභාපති මර්වින් ද සිල්වා අනුස්මරණය වෙනුවෙනි. ඔහු ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධ පුවත්පත් කර්තෘවරුවෙකි. තීරු ලේඛකයෙකි. විදේශ වර්තාකරුවෙකි. මෙම සම්මානය සඳහා විශිෂ්ටත්වය ද ජනමාධ්‍ය කලාවේ උත්තරීතර චර්යාධර්ම හා එකට කැටි වූ සාරධර්ම සැලකිල්ලට ගැනේ. මෙම සම්මානය ශ්‍රී ලංකාවේ පුවත්පත් කර්තෘවරුන් හා ජනමාධ්‍යවේදීන් සඳහා ද විවෘතය. රටට හා සමා-ජයට බෙහෙවින් වැදගත් වන ප්‍රශ්න හා කරුණුකරණා ඉල්ලුම් පත්‍රයට ඇතුළත් විය යුතුය. මෙම අග්‍රසම්මානයේ ඉල්ලුම්කරුවන් දක්ෂ හා විචක්ෂණ ලෙසත් නිර්මාණාත්මක ලෙසත් මාධ්‍ය භාවිතා කළ යුත්තේය. ඉල්ලුම්කරු/කාරිය ජනමාධ්‍ය කලාවේ විචාරණයේ හා විමසීමේ නොතිත් ආශාවෙන් හා ගවේෂණාත්මක ජනමාධ්‍ය කලාවේ අභ්‍යන්තරයටම සොයා යන්නෙකු විය යුතුය. තර්ජන ගර්ජන හා විවිධ අභියෝග මැද තම ජනමාධ්‍ය මෙහෙවර ධීර වීර ලෙසත් නොබියවත් සංවේදී ප්‍රශ්න දැඩි වගකීමකිනුත් සොයා බැලීම මෙම සම්මානය හිමිකර ගැනීමේ මඟ එළිපෙහෙළි කරයි. කතාවේ වැදගත්කම විස්තර කරමින් කර්තෘ වරයාගේ හා ඉල්ලුම් කරුගේ හා සටහනක් ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය. එම සටහන වචන 250 ට නොවැඩි විය යුතුය.

### 2) වසරේ ගවේෂණාත්මක ජනමාධ්‍යවේදියා

එක් සම්මානයකි.
තනිකරම විනිවිද පෙනෙන ස්වරූපයේ ගවේෂණාත්මක ප්‍රවෘත්තිය සඳහා ජනමාධ්‍යවේදියකුට හෝ කණ්ඩායමකට හෝ මෙම සම්මානය පිදේ. විනිවිද පෙනෙන ස්වභාවයෙන් පූර්ණත්වයට හා නිවැරදිව ප්‍රකාශයට පත් වූ එම ප්‍රවෘත්තිය ජාතික වැදගත්කමකින් අනූන විය යුතුය. බරපතල අපරාධ දේශපාලන දූෂණය හෝ ඒකාබද්ධ සමාගමක දුශ්චරිත හෝ නීතිවිරෝධී ක්‍රියා එවැනි ගවේෂණාත්මක ප්‍රවෘත්තියක ප්‍රස්තුතය විය හැකිය. එවැනි කතාවක් ලිවීම සඳහා සිදුකල පර්යේෂණ ක්‍රමද එම ගවේෂණයේදී ජනමාධ්‍යවේදියා දැක් වූ වෘත්තියමය දක්ෂතා හා ගුණාංග ද එම ගවේෂණ හෙළිදරව්වෙන් සමාජයේ හෝ බලධාරීන් අතර ඇතිවූ බලපෑමද විනිසුරුවන්ගේ සැලකිල්ලට ලක් වේ. එම ගවේෂණාත්මක කතාව හුදෙක්ම සෙසු පුවත්පත්වලට පෙර තම පුවත්පතේ පළ කළ උණුසුම් කතාවක් වීම නොවැදගත්ය. එය කලින් ලියූ කතාවක් යළි සවිස්තරාත්මකව ගවේෂණාත්මකව ඉදිරිපත් කිරීමක් විය හැකිය. එහෙත් එහි ජාතික වැදගත් කමක් හා පොදු ජන යහපතට වැදගත් කරුණු කරණා අඩංගු විය යුතුය. එක් පුද්ගලයකු හෝ කණ්ඩායමක් හෝ විසින් ඉදිරිපත් කරන එවැනි ඉල්ලුම්පතක් සමඟ කර්තෘගේ හා ඉල්ලුම්කරුගේ සටහනක් අමුණා තිබිය යුතුය. එවැනි සටහනක් වචන 250 ට නොවැඩි විය යුතුය.

### 3) අනෙක් පුවත්පත් හි පල කිරීමට පෙර තම පුවත්පතේ පල කල උණුසුම් පුවතට පිදෙන වසරේ සම්මානය

එක් සම්මානයකි.
මෙම අංශයෙන් වසරේ උණුසුම් පුවත හිමි ජනමාධ්‍යවේදියාට හෝ ජනමාධ්‍යවේදී කණ්ඩායමට සම්මානය පිදේ. එසේ සම්මාන පිදෙනුයේ සෙසු පුවත්පත්හි පළනොවූ "උණුසුම් පුවතක්" වෙනුවෙනි. එය ජාතික වැදගත්මකින් අනූන කතාවක් විය යුතුය. එක මාධ්‍යවේදියකු හෝ මාධ්‍යවේදීන් කණ්ඩායමක ඉල්ලුම්පතක එවැනි "උණුසුම් පුවතක්" මීට පෙර අන් කිසිම ජනමාධ්‍යයක පළ නොවූ බව දැක්වෙන කර්තෘ ප්‍රකාශයක් ඉල්ලුම්පත සමඟ අමුණා තිබිය යුතුය.

**4) වසරේ තරුණ ජනමාධ්‍ය වේදියා වෙනුවෙන් පිදෙන ඩෙන්සිල් පීරිස් සම්මානය**

එක් සම්මානයකි.

ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ හැකි අවම වශයෙන් ඉදිරිපත් කිරීම් (ප්‍රකාශන 10කි). මෙම සම්මානය පිරිනැමුයේ ශ්‍රී ලංකාවේ ජීවත් වූ විශිෂ්ටතම ජනමාධ්‍යවේදියකු වූ ඩෙන්සිල් පීරිස් වෙනුවෙනි. අතිශයින් කීර්තිමත් ජනමාධ්‍යවේදියකු වූ ඩෙන්සිල් පීරිස් ශ්‍රී ලංකාවෙන් බිහි වී, ශ්‍රී ලංකාව විදේශයන්හි බොහෝ සෙයින් බැබලීමට ලක් කළ විශිෂ්ට මාධ්‍යවේදියෙකි. 2017 දෙසැම්බරය වන විට වයස අවුරුදු 26 ක් සපිරෙන ජනමාධ්‍යවේදියකු වෙනුවෙන් මෙම සම්මානය පිරිනැමේ. හරවත් හා යහපත්ම මාධ්‍ය කලාවකට ගැඹුරු වූ නිවැරදි වාර්තාකරණය හා කැටි කළ උත්තුංග ජනමාධ්‍ය සාරධර්ම හා ගුණාංග පුරුදු පුහුණු කරමින් එහි ආකර්ශනීයත්වය ඔප මට්ටම් කරන කරුණ ජනමාධ්‍යවේදියෙක් මෙම සම්මානයට සුදුසුකම් ලබයි. වාර්තාකරණය හා විශේෂාංග යන දෙඅංශයම මනා ලෙස කැටි වූ පරිපුර්ණ ලෙස ඉදිරිපත් කරන කරුණු කාරණා කෙරෙහි විනිශ්වයකාරවරුන්ගේ අවධානය යොමුවනු ඇත. ප්‍රශ්නෝත්තර සම්භාව්‍යයේ සම්මුඛ සාකච්ඡා භාර නොගැනේ. ජයග්‍රාහකයාට ලක්ෂ්මන් කදිර්ග ාමර් පදනමේ ශිෂ්‍යත්වය හිමි වෙයි. ඒ එතෙරදී ජනමාධ්‍ය කලාව ඉගෙනීම සඳහාය.

**5) වසරේ හොඳම සුව සේවා හා වෛද්‍ය වාර්තාකරණය සම්මානය (සිංහල / දෙමළ / ඉංග්‍රීසි)**

භාෂා තුනෙන් සම්මාන තුනකි. එක් භාෂාවකින් එක් සම්මානයකි.

ඉල්ලුම්පතක් සමග අවම වශයෙන් ඉදිරිපත් කිරීම් ( ප්‍රකාශන 10ක් ) යොමු කළ යුතුය. සෞඛ්‍ය ප්‍රශ්න සම්බන්ධයෙන් නිරන්තරයෙන්ම කතා ලියා පළ කරන මාධ්‍යවේදීන්ට මෙම අංශය විවෘත වෙයි. සෞඛ්‍ය ප්‍රශ්න, ප්‍රතිකාර හා පාලනය සවිස්තරව පාඨකයාට ඉදිරිපත් කරන කතා සම්මානය සඳහා ඉදිරිපත් කළ යුතුය. පුවත්පත් නිවේදනයකට හෝ නොමිලේ බෙදා-දෙන වෙනත් ලියවිල්ලකට, අත්පත්‍රිකාවකට එවැනි කතා සීමා නොවිය යුතුය. එවැනි කතා පර්යේෂණයට ලක්වූ මට්ටමෙන් ඉදිරිපත් කළ යුතු වේ. වෛද්‍ය විද්‍යාවේ නොතේරෙන වදන් වලින් බැහැර විය යුත්තේය. වෛද්‍යවරයකු සමග පවත්වන සෞඛ්‍ය සාකච්ඡාව සරල බසින් පැහැදිලි කළ යුත්තේය. වෛද්‍යවරයා විසින් විස්තර කරනු ලබන සෞඛ්‍ය ප්‍රශ්න පිලිබඳව ඔහු දක්වන අදහස් කිසියම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ඔහු ඉදිරිපත් කරන මර්දන ක්‍රම හා ප්‍රතිකාර ක්‍රම පැහැදිලිව ඉදිරිපත් කළ යුතුය.

**6) වසරේ පාරිසරික මාධ්‍යවේදියා (සිංහල / දෙමළ / ඉංග්‍රීසි)**

භාෂා තුනෙන් සම්මාන තුනකි.

ඉල්ලුම් පත්‍රයක් සමග අවම වශයෙන් ඉදිරිපත් කිරීම් ( ප්‍රකාශන 10ක්) යොමු කළ යුතුය. පරිසරය ඉලක්ක කර ගෙන වර්ෂය පුරා ලියු පාරිසරික කථා මෙම සම්මානයට යොමු කළ හැකිය. තනි පුද්ගලයකුයට හෝ මාධ්‍යවේදීන් කණ්ඩායමකට මෙම සම්මානය පිදේ. පරිසර සංරක්ෂණය හෝ පරිසර විනාශයේ හෙළිදරව් සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් කළ හැකිය. පරිසර මාධ්‍යවේදීන් දිගු කාලයක් පුරා කරගෙන යන ගවේෂණ හා දිගින් දිගටම ලියන පරිසර කතා මේ සඳහා යොමු කළ හැකිය. පරිසරය සුරැකීමේ වැදගත්කම පාඨකයාගේ ඇගයීමට ලක්වන ආකාරයේ මනා ලෙස විද්‍යාත්මක පදනමක පිහිටා සිදුකළ පර්යේෂණ මත කථා යොමු කිරීම වැදගත් වේ. සමාජයට තදින් හා නිශ්චිත ලෙස බලපෑම් ඇති කරන බලධරයන් ක්‍රියාත්මක වන ආකාරයෙන් ඉදිරිපත් කරන කතා සැලකිල්ලට ගැනේ.

**07) වසරේ ක්‍රීඩා ජනමාධ්‍යවේදියා (සිංහල / දෙමළ / ඉංග්‍රීසි)**

භාෂා තුනෙන් සම්මාන තුනකි.

ඉල්ලුම් පත්‍රය සමග අවම වශයෙන් (ප්‍රකාශන 10ක්) එවිය හැකිය. ක්‍රීඩා වාර්තාකරණයේ විශේෂ දක්ෂකම් දක්වන මාධ්‍යවේදියකුට මෙම සම්මාන පිරිනැමේ. මතුපිටින් පෙනෙන දේට වඩා තිරයෙන් පිටුපස සිදුවන දේ අලලා තම විෂය ගැන අගය එකතු කළ සවිමත් වාර්තා මේ සඳහා සලකා බැලේ. ක්‍රීඩාවේ එක් විෂයක් හෝ විෂයන් කිහිපයක් සම්බන්ධයෙන් ඉල්ලුම්කළ හැකිය. වෙනත් මාධ්‍යයක පල නොවූ සම්මුඛ සාකච්ඡා හා වාර්තා වැඩසටහන් වැනි යම් විෂයක් ඔස්සේ යලි ලියන ලද උණුසුම් ක්‍රීඩා කතාද සලකා බැලේ.

**08) වසරේ හොඳම නිර්මාණාත්මක පුවත්පත**

එක් සම්මානයකි.

ඉල්ලුම් පත්‍රයක් සමග යොමු කළ හැකි ඉදිරිපත් කිරීම් (ප්‍රකාශන සංඛ්‍යාව 5කි) මුළු පුවත්පතේ සියලු අංශ වෙනුවෙන් ශ්‍රී ලංකාවේ නිර්මාණය කෙරෙන හොඳම පුවත්පත සඳහා තනි පුද්ගලයකුට හෝ කණ්ඩායමකට මෙම සම්මානය පිදේ. හොඳම පුවත්පත යනු නිමාව ලස්සන පුවත්පතකි. පාඨක මිත්‍රයෙකි. ආකර්ශනීය පුවත්පතකි. පොදු ජන සිතට කා වදින පුවත් පතකි. සිත් කළු පුවත්පතකි. පුවත්පතේ සැකැස්ම නිර්මාණය විවිධ අංශයෙහි විවිධ හැඩතල පෙළගැස්ම ආදිය ඉදිරිපත් කිරීම රූ රටා ගැන විනිසුරුවන්ගේ සැලකිල්ලට යොමු වේ. නිර්මාණයෙන් හා කථා පෙළගැස්මෙන් පාඨක රුචිය ඇද බැඳ ගන්නා ආකාරය කෙරෙහි විනිසුරුවන්ගේ අවධානයට යොමු වේ.

**09) වසරේ ව්‍යාපාර හා මූල්‍ය ජනමාධ්‍යවේදියා (සිංහල / දෙමළ / ඉංග්‍රීසි)**

එක් භාෂාවකින් එක් සම්මානයකි.

ඉල්ලුම්පත සමග යොමු කළ හැකි අවම ඉදිරිපත් කිරීම් (ප්‍රකාශන 10කි). ආර්ථිකය මූල්‍ය කටයුතු හා ව්‍යාපාරික අවබෝධය කැටි කළ ව්‍යාපාරික පුවත් පාඨකයාට නිරන්තරයෙන් සමීප කරන ජනමාධ්‍යවේදියාට මේ සම්මානය පිරිනැමේ. සාධාරණය හා නිවැරදි ලෙසින් ජනම-ාධ්‍ය කලාවේ ආචාරධර්ම ඉහළින්ම අනුගමනය කරමින් ලියූ කතා සැලකිල්ලට ගැනේ.

උණුසුම් පුවත් එසැණින් ඉදිරිපත් කිරීමේ හැකියාව වෙළෙඳපොලේ ප්‍රවණතා කලින් දැකීම හා වෙළෙඳපොල සංකීර්ණ ප්‍රශ්න පොදු පාඨකයාට පැහැදිලි කිරීම මෙහෙදී විනිශ්චයට ලක්වේ. තම ප්‍රධාන පාඨකයා හඳුනාගැනීම හා ඔහු ඇඳ බැඳ ගන්නා ශෛලයකින් වාර්තා ඉදිරිපත් කිරීම වැදගත් වේ. ප්‍රශ්න හා උත්තර ස්වරූපයෙන් සම්මුඛ සාකච්ඡ ඉදිරිපත් නොකළ යුතුය. එමෙන්ම පුවත්පත් නිවේදන පාදක කොටගත් ප්‍රවෘත්ති මෙම සම්මානය සඳහා සුදුසුකම් නොලබයි.

**10) වසරේ කාටූන් ශිල්පියා ( සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි)**

භාෂා තුනෙන් සම්මාන තුනකි.

ඉල්ලුම්පත්‍රය සමග යොමු කළ හැකි ඉදිරිපත් කිරීම් අවම සංඛ්‍යාව දහයකි. රටේ හැඟීම් දක්ෂ ලෙසත් තම පරිගණක රූ රටා මගින් හෝ හාස්‍යෝත්පාදක සිතුවම් මගින් දක්වන විවේචන වෙනුවෙන් මේ සම්මානය පිදේ. භාෂා බාධකය ජයගෙන චිත්‍රයෙන් හා උපහාසයෙන් රටේ පොදු ප්‍රශ්න ඉදිරිපත් කරන කාටූන් ශිල්පියාගේ නිර්මාණ ගැන විනිසුරුවරුන්ගේ අවධානය යොමු වන්නේය.

**11) සුවිශේෂ අවස්ථා වාර්තාකරණය සඳහා වන කයිලාසිපති සම්මානය ( සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි)**

භාෂා තුනෙන් සම්මාන තුනකි.

ඉල්ලුම්පත්‍රය සමග අවම ඉදිරිපත් කිරීම් (ප්‍රකාශන දහයක්) එවිය හැකිය.

විද්වතකු හා ජනමාධ්‍යවේදියෙකු වූ මහාචාර්ය කේ. කයිලාසිපති අනුස්මරණය සඳහා මෙම සම්මානය පිදේ. ශ්‍රී ලංකාවේ ස්වාධීන දෙමළ පාඨක සමූහයක් බිහි කර ගැනීමට සටන් කළ මහාචාර්ය කයිලාසිපති දේශීය දෙමළ පුවත්පත් කලාව එදා වැටී සිටි දකුණු ඉන්දියා ග්‍රහණයෙන් රැක බලා ගත්තේය. ස්වභාවික ලෙස දැඩි පීඩනයක් යටතේ (පීඩනය කුමක්දැයි සඳහන් කළ යුතුය) පෞද්ගලික හා වෘත්තීය නිදහස බරපතළ තර්ජනයකට ලක් වීමේ අවස්ථාවක දී තම ජීවිතයට එල්ල වූ එම තර්ජන හෝ එවැනි බරපතළ අවස්ථාවන්හිදී එම තර්ජන පිළිබඳව පුරවැසියන් මනා ලෙස දැනුවත් කරමින් මාධ්‍යවේදියෙකු හෝ මාධ්‍යවේදීන් කණ්ඩායමක සුවිශේෂී වාර්තා මෙම සම්මානයට ඉදිරිපත් කළ හැකිය. එම වාර්තාව සැපයූ පුද්ගලයා හෝ කණ්ඩායම මරණයට පත් වූ අවස්ථාවකදී ඔවුන්ගේ මරණයෙන් පසුවද මෙම සම්මානය පිදිය හැකියි. එහෙත් ඒ සඳහා ලේඛකයාගේ පවුලේ සාමාජිකයෙකු හෝ ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ සාමාජිකයෙකුගේ සහතිකයක් අවශ්‍ය වන්නේය.

**12) වසරේ ඡායාරූප මාධ්‍යවේදියා**

එක් සම්මානයකි.

ඉල්ලුම්පත්‍රය සමග අවම වශයෙන් ඉදිරිපත් කිරීම් (ප්‍රකාශන දහයක් ) එවිය හැකියි. වසරේ හොඳම ප්‍රවෘත්ති හෝ විශේෂාංග / ඡායාරූප කැමරා කාචයට හසුකර ගැනීමේ හපන්කම් ඇති තාක්ෂණයෙන් පිරිපුන් ඡායාරූප මාධ්‍යවේදීන් මීට සුදුසුකම් ලබති. වසරේ පිළිගත් ඉතා හොඳ ප්‍රවෘත්ති හා විශේෂාංග ඡායාරූප මේ තරගයේදී විනිසුරුවරුන්ගේ සැලකිල්ලට යොමු වේ. විවිධත්වය ඡායාරූප ශිල්පයේ ඉතිරී පැතිරී ගිය විවිධ දස්කම් නොයෙකුත් දේ පිළිබඳ පැතිරී ගිය දැනුම ඡායාරූප ලස්සනට කපා කොටා ඉදිරිපත් කිරීම හා අවශ්‍ය ඡායාරූප කාචගත කිරීමේ හැකියාව විනිසුරුවරු වෙසෙසින් සලකා බලති, සම්මුඛ පරීක්ෂණයකදී ගැනෙන ඡායා-ාරූපයක හෝ විශේෂාංගයකට ගැනෙන ඡායාරූපයක විවිධ ඉරියව් මතුකර පෙන්වීමේ හැකිය-ාව දැඩි ලෙස මෙවැනි ඡායාරූපයකදී ඉස්මතු විය යුත්තේය. හැම ඡායාරූපයකටම විස්තර කැප්ෂනයක් ඉදිරිපත් කළ යුත්තේය. නොපැහැදිලි හා දුර්වල ඡායාරූප ඩිජිටල් මගින් වෙනස් කළ ඡායාරූප හෝ පුවත්පත් සිරස්තලවලට යොදාගත් ඡායාරූප මෙම තරගයට බාර නොග ැනේ. හැම ඡායාරූපයක්ම රාමු කර ඉදිරිපත් කළ යුත්තේය.

**13) බී . ඒ . සිරිවර්ධන වසරේ තීරු ලිපි සම්මානය ( සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි)**

භාෂා තුනෙන් සම්මාන තුනකි.

ඉල්ලුම්පත්‍රය සමග අවම ලෙස ඉදිරිපත් කිරීම් ( ප්‍රකාශන දහයක්) එවිය හැක්කේය. බොහෝ අංශයන්හි පැතිරී ගිය දැනුමෙන් යුත් කර්තෘවරයෙකු වෙනුවෙන් බී. ඒ. සිරිවර්ධන සම්මානය පිදේ. තමන්ගේ අදහස් බිය සැක නැතිව ද ප්‍රබෝධවත් ලෙසද පාඨක රුචිය ඉස්මතු වන ලෙසද ඉදිරිපත් කළ යුතුය. මෙම තීරු ලිපිය නමින් හෝ ආරූඪ නමකින් ලිවිය හැකිය.

(ඉල්ලුම්පත් එවිය යුතු නීතිරීති සටහන් පරිශීලනය කරන්න) මෙම තීරු ලිපිය පුවත්පතක නිරන්තරයෙන් පළ වන්නක් විය යුතුය. ලේඛකයාගේ සුවිශේෂ අසමසම ශෛලිය පිළිබඳව විනිසුරුවරු සොයා බලති. වසරකදී අඩු ගණනේ එවැනි තීරු ලිපි දොළහක්වත් ප්‍රකාශයට පත් වී තිබිය යුත්තේය. ඉදිරිපත් කිරීම් දිගින් කොළමකට හෝ දෙකකට නොවැඩි විය යුත්තේය. එය සම්පූර්ණ පිටවක් නොවිය යුත්තේය.

**14) සමාජ ප්‍රශ්න පිලිබඳ සුබ්‍රමනියම් චෙට්ටියාර් සම්මානය**

එක් සම්මානයකි.

ඉල්ලුම් පත්‍රය සමග අවම වශයෙන් ඉදිරිපත් කිරීම් (ප්‍රකාශන දහයක් ) ඉදිරිපත් කළ හැකිය. වර්ෂ 1930 දී වීරකේසරී පුවත්පත ආරම්භ කළ සුබ්‍රමනියම් චෙට්ටියාර් නමින් මෙම සම්මානය පිදේ. චෙට්ටියාර් හැමවිටම සේවකයන් වෙනුවෙන් සටන් කළේය. සාධාරණ ලෙසත් ආචාර ධර්මානුකූල ලෙසත් හඬක් නැති යට හඬක් දෙන ආකාරයෙනුත් ඉදිරිපත් කරන සමාජ ප්‍රශ්න වෙනුවෙන් මෙම සම්මානය පිදේ. එවැනි සමාජ ප්‍රශ්න සඳහා මාධ්‍ය මගින් විසඳුම් සොයන වාර්තාකරුවෝ මේ සඳහා සුදුසුකම් ලබති. එවැනි වාර්තාකරුවෙකු එම සමාජ ප්‍රශ්නය එසැණින් නැවුම් ලෙස ඉදිරිපත් කළ යුතු අතර එම ප්‍රශ්නයට සමාජ සාධාරණය ඉටු වනතුරු ඔහු තම කතාව අතරමගදී අත් නොහල යුත්තේය. හැම විටම ඔහු සමාජ ප්‍රශ්න ඉස්මතු කළ යුත්තේය.

**15 වසරේ විශේෂාංග ලේඛකයාට පිදෙන උපාලි විජයවර්ධන සම්මානය ( සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි)**

භාෂා තුනෙන් සම්මාන තුනකි.

ඉල්ලුම් පත්‍රය සමග අවම වශයෙන් ඉදිරිපත් කිරීම් ( ප්‍රකාශන දහයක්) එවිය හැකිය. සීමාසහිත උපාලි පුවත්පත් සමාගමේ නිර්මාතෘ අභාවප්‍රාප්ත උපාලි විජයවර්ධන අනුස්මරණය කිරීම් වස් මෙම විශේෂාංග විවිධත්වය පිළිබිඹු කළ යුත්තේය. ප්‍රශ්නගත මූලික හරය අන්තර්ගත විය යුත්තේය. එම ප්‍රශ්න පිබඳව පාඨකයාට පැහැදිලි අවබෝධයක් ලැබිය යුත්තේය. එමෙන්ම එම ලිපිය සාධාරණ හා නිරවද්‍ය විය යුත්තේය. පුවත්පත් කළාවේ ඉහළම සාරධර්ම වලින් පරිපූර්ණ විය යුත්තේය. ලියැවිල්ලේ භාෂාව හා ගුණාත්මක තත්වය බෙහෙවින්ම වැදගත් වන්නේය. ප්‍රවෘත්ති විශේෂාංග ලිවීමේදී මනා ශෛලයක් හා රටාවක් ගැන විනිසුරුවරු අවධානය යොමු කරති. මානව දයාවෙන් සපිරි කතාවක සිට සංචාරක කතාවක් දක්වා මාතෘකාව පුළුල් කර ගත හැකියි. එවැනි විශේෂාංගයක් ප්‍රධාන මාතෘකාවටම පමණක් සීමා නොවිය යුත්තේය. දෙදෙනෙකු අතර පවත්වන සම්මුඛ සාකච්ඡා භාර නොගැනේ.

**16) වසරේ හොඳම ප්‍රවෘත්ති වෙබ් අඩවිය ( සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි)**

එක් භාෂාවකින් එක් සම්මානයකි.

මෙම සම්මානය පිදෙන්නේ මුද්‍රිත පුවත්පත් ස්වරූපයේ පුවත්පත් වෙබ් අඩවිවලට පමණි. මුද්‍රිත වෙබ් අඩවියද ප්‍රවෘත්ති වෙබ් අඩවියද 2017 ජනවාරි පළමුවැනිදා සිට පවත්වා ගෙන ආ යුත්තේය. සම්මාන පිදෙන අවස්ථාව වන විට එම වෙබ් අඩවි ක්‍රියාත්මක විය යුත්තේය. සම්මානය පිදෙනුයේ අන්තර්ගතය නිර්මාණය සරලව වෙබ් අඩවියට පිවිසීමේ හැකියාව දෘශ්‍ය නිර්මාණය ක්‍රියාකාරිත්වය හා අන්තර් ක්‍රියාකාරිත්වය අතින් හොඳම වෙබ් අඩවියටවේ. පරිගණකයකින් කියවීමේ හෝ පිටපත් ලබා ගැනීමේ පෝර්ටබල් ඩොකියුමන්ට් පෝර්මැට් ) P.D.F) ක්‍රමයට ලබා ගත් පවර්පොයින්ට් ස්ලයිඩ් දහයකට නොවැඩි උපාංගයක් (සීඩි තැටියක් ) ඉදිරිපත් කළ යුතුය. තම වෙබ් අඩවියේ ස්ක්‍රීන් කැප්ෂන් හා සුවිශේෂි ලක්ෂණ එහි ඇතුළත් විය යුතුය. මැයි හා ජුනි මාසවල සත් දිනක් ඇතුළතදී විනිසුරුවරු මෙම වෙබ් අඩවි හා පවර්පොයින්ට් ඉදිරිපත් කිරීම සමාලෝචනය කරති.

**17) තොරතුරු දැනගැනීමේ පනත භාවිතයෙන් සම්පාදනය කරන ලද හොඳම ප්‍රවෘත්ති / විශේෂාංග ලිපිය**

එක් භාෂාවකට එක බැගින් භාෂා තුනට සම්මාන තුනකි.

තොරතුරු දැනගැනීමේ පනත භාවිතා කරමින් ලබාගන්නා ලද තොරතුරු ආශ්‍රයෙන් සම්පාදනය කරන ලද ප්‍රවෘත්ති හෝ විශේෂාංග මෙම සම්මානය මගින් ඇගයීමට ලක්කරයි. පනත හරහා ලබාගන්නා තොරතුරු ලිපියේ අන්තර්ගත විය යුතුය.

## ශ්‍රී ලංකා කර්තෘ සංසදයෙන් නම් කෙරෙන විශේෂ සම්මාන

- පුවත්පත් කලාවේ විශාරදයන්ගේ (පඩුවන්) හා මහජන ඇගයීම වෙනුවෙන් පිදෙන ඩී. ආර්. විජයවර්ධන සම්මානය

- ශ්‍රී ලංකාවේ පුවත්පත් නිදහස ආරක්ෂා කිරීම වෙනුවෙන් පිදෙන සේපාල ගුණසේන සම්මානය

- දීර්ඝ හා විශිෂ්ට සේවා සම්මානය



පෑනේ සිහිවටනය